

# 20

# හදීස් - I

## (කුද්සි, නබවි)

"වහී" යන පදයෙන් වැදගත් කරුණු දෙකක් අදහස් කෙරේ. එකක් අල්ලාහු තආලාගේ කලාමය වන අල් කුර්ආනය යි. මෙය **"වහී මත්ලුව්වු"** (පාරායනය කර පෙන්වූ වහී) යන නමින් හැඳින්වේ. අනෙක නබි සල්ලල්ලාහු අලෛහිවසල්ලම් තුමාගේ හදීසය වේ. මෙය **"වහී ගයිරු මත්ලුව්වු"** (පාරායනය කර නොපෙන් වූ වහී) නමින් හැඳින්වේ.

අපි මෙම පාඩමෙන් වහීවල දෙවැනි අංගය වන හදීසය පිළිබඳව දැන ගනිමු.

නබි සල්ලල්ලාහු අලෛහිවසල්ලම් තුමාණන්ගේ වචන (කතාව) ද "වහී" ලෙස පහළ වූවක් බව පහත දැක්වන අල් කුර්ආන් වැකිය මගින් තහවුරු වේ.

එනම් :

وَمَا يَنْطِقُ عَنِ الْهَوٰى اِنْ هُوَ اِلَّا وَحْيٌ يُّوْحٰى

**ඔහු (තම) මනෝ ඉච්ඡාවට අනුව කතා නොකරයි. (ඔහු කතා කරන) එය පහළ කරනු ලබන වහී (දේව පණිවිඩයක්) මිස වෙන කිසිවක් නොවේ. (අල් කුර්ආන් 53 : 3, 4)**

එසේ ම නබි සල්ලල්ලාහු අලෛහිවසල්ලම් තුමාණන් ද මෙසේ පවසා ඇත.

أَلَا وَإِنِّي أُوتِيتُ الْقُرْآنَ وَمِثْلَهُ مَعَهُ

''දැනගන්න! මාහට අල් කුර්ආනය ද එයත් සමඟ එවැනි තවත් දෙයක් ද පිරිනමන ලදි''. (මූලාශ්‍රය : අබූදාවූද්, අහ්මද්)

ඉහත සඳහන් පරිදි හදීස් වහී යන මාතෘකාව යටතේ අඩංගු වී ඇතත් අල් කුර්ආනය හා හදීසය අතර මූලික වශයෙන් අල් කුර්ආනය හා හදීසය අතර විවිධ වෙනස්කම් දක්නට ලැබේ. අල් කුර්ආනයේ වචන එහි අන්තර්ගතය යන සෑම දෙයක් ම අල්ලාහු තආලාගෙන් පහළ වූ ඒවා ය. හදීසයේ අන්තර්ගතය අල්ලාහ් මගින් දැනුම් දුන් දේ වන අතර එහි වචන මාලාව නබි සල්ලල්ලාහු අලෛහිවසල්ලම් තුමාගේ වදන් ලෙස සැකසී තිබේ. මෙය අල් කුර්ආනය හා අල් හදීසය අතර පවතින මූලික වෙනස්කම වේ.

**හදීසිය 'හදීස් කුද්සි', 'හදීස් නබවි' ලෙස දෙවර්ගයකට බෙදේ.**

## හදීස් කුද්සී

"අල්ලාහ් පවසයි" යනුවෙන් නබි සල්ලල්ලාහු අලෛහිවසල්ලම් තුමා විසින් පවසන ලද හදීස් වර්ග 'හදීස් කුද්සි' යන නමින් හඳුන්වනු ලබයි. නිදසුනක් ලෙස,

يَقُولُ رَسُولُ اللهِ صَلّى اللهُ عَليهِ وَسَلَّمَ عَنِ اللهِ سُبْحَانَهُ وَتَعَالَى: "قال اللهُ أَعْدَدْتُ لِعِبَادِي الصَّالِحِينَ مَا لاَ عَيْنٌ رَأَتْ وَلاَ أُذُنٌ سَمِعَتْ وَلاَ خَطَرَ عَلَى قَلْبِ بَشَرٍ" (رواه البخاري )

අල්ලාහ් මෙසේ පවසන බව නබි සල්ලල්ලාහු අලෛහිවසල්ලම් තුමාණෝ පැවසූහ. " මාගේ සාලිහ් වන යහගැත්තන්ට කිසි දු ඇසක් නොදුටු, කිසිඳු කනක් නොඇසූ, මිනිස් චින්තන ශක්තියට ළඟා නොවනා දේ මම සූදානම් කර තබා ඇත්තෙමි".
(මූලාශ්‍රය : බුහාරි)

**අල් කුර්ආනය හා හදීස් කුද්සි අතර ඇති වෙනස්කම් මෙසේ ය.**

1. අල් කුර්ආනය ජිබ්රීල් අලයිහිස්සලාම් තුමා මගින් පහළ කරන ලදි. හදීස් කුද්සි ජිබ්රීල් අලෛහිස්සලාම් තුමා මාර්ගයෙන් හා සමහර අවස්ථාවල දී වෙනත් ආකාරවලින් ද පහළ විය.

2. අල් කුර්ආනය සම්පූර්ණයෙන් ම "මුතවාතිර්" නම් පරිපූර්ණ විශ්වාසවන්ත බවින් යුක්ත ය. 'හදීස් කුද්සි' එසේ නොවේ. එහි විවිධ වර්ග ඇත.

3. අල් කුර්ආනය සලාතයේ දී පාරායනා කරන්නකි. එසේ ම එය පාරායනය කිරීම නැමඳුමකි. නමුත් 'හදීස් කුද්සි' එසේ නොවේ.

4. අල් කුර්ආනය මුඃජිසාත්වලින් එකකි. 'හදීස් කුද්සි' මුඃජිසාත්වලට අයත් නොවේ.

5. අල් කුර්ආනය වැකි 6666කට සීමා කරන ලද්දකි. නමුත් හදීසුල් කුද්සියේ සංඛ්‍යාව නිශ්චිත ව කියැවී නොමැත.

6. පොදුවේ සම්පූර්ණ අල් කුර්ආනය ම මිනිස් සිත්වල වනපොත් වී තිබේ. නමුත් හදීස් කුද්සිය එලෙස වනපොත් කළ නොහැකිය.

7. හදීස් කුද්සි පෙළඹවීම බිය ගන්වා අවවාද කිරීම අපේක්ෂා සහිත විශ්වාසය යන අංශයන්ට වැඩි වශයෙන් නැඹුරු වී ඇත.

## හදීස් නබවි

මෙම හදීස් වර්ගයෙහි නබි සල්ලල්ලාහු අලෛහිවසල්ලම් තුමාණන්ගේ වචනය, ක්‍රියාව, අනුමැතිය හා එතුමාගේ යහගුණාංග යනාදිය අන්තර්ගත ය. එයින් වචන සම්බන්ධ දෑ "කව්ලි" යනුවෙන් ද ක්‍රියා සම්බන්ධ දෑ "ෆිඅලි" යනුවෙන් ද අනුමත කළ දෑ "තක්රීර්" යනුවෙන් ද නම් කෙරේ. පහත සඳහන් 'හදීස්' ඒවාට නිදසුන් වේ.

قَالَ النَّبِيُّ صَلَّى اللَّهُ عَلَيهِ وَسَلَّمَ :"كَلِمَتَانِ خَفِيْفَتَانِ عَلَى اللِّسَانِ، ثَقِيْلَتَانِ فِيْ الْمِيْزَانِ، حَبِيْبَتَانِ إِلَى الرَّحْمَنِ سُبْحَانَ اللهِ وَبِحَمْدِهِ: سُبْحَانَ اللهِ الْعَظِيْمِ، ".

"(පැවසීමට) දිවට පහසු වූ ද, තරාදියට බර වූ ද, අල්ලාහු තආලාට ඉතා ප්‍රියත ම වචන දෙකක් ඇත්තේ ය. එනම්, එය "සුබ්හානල්ලාහි වබිහම්දිහී සුබ්හානල්ලාහිල් අලීම්" යන්න වේ" යැයි නබි සල්ලල්ලාහු අලෛහිවසල්ලම් තුමාණෝ පැවසූහ. (බුහාරි සහ මුස්ලිම්)

قَالَ النَّبِيُّ صَلَّى اللَّهُ عَلَيهِ وَسَلَّمَ : "إِذَا كُنْتُمْ ثَلَاثَةً، فَلَا يَتَنَاجَ رَجُلَانِ دُوْنَ الْآخَرِ حَتَّى تَخْتَلِطُوا بِالنَّاسِ أَجَلَ أَنْ يَحْزِنَه".

''ඔබ තිදෙනෙකු සිටිනා විට, තුන්වැන්නා තනිකර දමා දෙදෙනකු අතර රහස් කතා නොකරන්න. එය ඔහුගේ සිතට කනගාටුව ගෙන දෙයි'' ( බුහාරි)

මෙසේ ලක්ෂ ගණනින් නබි වදන් තිබේ. ඉස්ලාමයේ ඇති හදීස්වලට මුල්තැන දී අපි ඒවා අපේ අනුගමනය කරන්නට උත්සාහ කරමු.

පාඩමේ ඇතුළත් වැදගත් අරාබි වචන

الْحَدِيْثُ   الْقُدْسِيْ   النَّبَوِيْ   الْوَحْيُ   مُعْجِزَاتٌ   مُتَوَاتِرٌ   وَحْيٌ مَتْلُوْ

وَحْيٌ غَيْرَ مَتْلُوْ   تَقْرِيْرِي   فِعَلِي   قَوْلِي

## අභ්‍යාස

අ) හරි නම් (✓) ලකුණ ද, වැරැදි නම් (X) ලකුණ ද යොදන්න.

1. හදීස් කුද්සි ඉස්ලාමයේ තුන්වන මූලාශ්‍රය වේ. ( )

2. අල් කුර්ආනය සම්පූර්ණයෙන් පිළිගැනීමට තරම් සුදුසු ග්‍රන්ථයකි. ( )

3. වචන, ක්‍රියා, අනුමත කළ දේ හදීස් නබවිහි අන්තර්ගත ය. ( )

4. අල් කුර්ආනය "වහී ගයිරු මත්ලුව්වු" ලෙස දැක්විය හැක. ( )

ආ) පහත සඳහන් කරුණු සඳහා උදාහරණ ලෙස හදීසයක් බැගින් ලියන්න.

- හදීස් කුද්සි
- හදීස් නබවි